# තෝරාගත් ප්‍රශ්න: ඉස්ලාම් ගැන නිතර අසන ප්‍රශ්න ශබ්දකෝෂයෙන්

# (අකර්ානුල් ඊමාන් හෙවත් දේව විශ්වාසයේ මූලිකාංග පිළිබඳ කොටස)

**ප්‍රශ්න අංක: 48**

## ඉස්ලාමයේ මූලික කුළුණු පහ කුමක් ද?

පිළිතුර:

වැදගත් කරුණ (1)

පි- ඉස්ලාමයේ මූලික කුළුණු පහ කුමක් ද?

පි: ඉස්ලාමය මූලික කරුණු පහක් මත ගොඩ නැගී ඇත. අල්ලාහ්ගේ දූතයාණෝ ඒ ගැන මෙසේ පවසා පැහැදිලි කළහ:ඉස්ලාමය කරුණු පහක් මත ගොඩ නැගී ඇත. එනම් නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නැති බව හා මුහම්මද් තුමාණන් අල්ලාහ්ගේ දූතයාණන් බව පවසා සාක්ෂි දැරීම, සලාතය විධිමත්ව ඉටු කිරීම, සකාත් පිරිනැමීම, හජ් වන්දනාව ඉටු කිරීම, රමළාන් මාසයේ උපවාසයේ නිරත වීම යනාදියයි.බුහාරි හා මුස්ලිම්

පළමු මූලිකාංගය: නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නැති බව හා මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අල්ලාහ්ගේ දූතයාණන් බව සාක්ෂි දැරීමයි. එනම්: උත්තරීතර අල්ලාහ් හැර සැබෑ ලෙස නැමදුම් ලබන කිසිවෙකු නොමැති බව විශ්වාස කිරීමය. එය එහි අර්ථය මැනවින් දැන ගැනීමත් සමග නපුරු බලවේග ප්‍රතික්ෂේප කිරීමට බැඳී, උත්තරීතර අල්ලාහ්ගේ පිළිවෙතට යටත් වී, ආදරය හා ගෞරවයෙන් යුතුව සුවිශුද්ධ අල්ලාහ්ට අවංක භාවයෙන් යුතුව කටයුතු කිරීමය.තවද සැබැවින්ම අල්ලාහ් ඒකීය යැයි ද ඔහු පරිපාලක, රජු, සැලසුම්කරු, මැවුම්කරු හා පෝෂක යැයි ද විශ්වාස කිරීම හා තමන් විසින් සහතික කළ හෝ තම දූතයාණන් විසින් සහතික කළ උසස් ගුණාංග හා අලංකාර සියලු නාම ඔහුට ස්ථිර කිරීමය.සැබැවින්ම අල්ලාහ් ඒකීය බවත් නැමදුම් ලබන්නට සුදුස්සා ඔහු පමණකි ඔහු හැර වෙනත් කිසිවකු ඒ සඳහා සුදුසුකම් නොලබන බවත් විශ්වාස කළ යුතුයි. මක්නිසාද යත් ඔහු එකම මැවුම්කරුය. ඔහුට කිසිදු හවුල්කරුවෙකු නොවීය. ශුද්ධ වූ අල්ලාහ් මෙසේ පවසයි.﴾ بَدِيعُ ٱلسَّمَٰوَٰتِ وَٱلۡأَرۡضِۖ أَنَّىٰ يَكُونُ لَهُۥ وَلَدٞ وَلَمۡ تَكُن لَّهُۥ صَٰحِبَةٞۖ وَخَلَقَ كُلَّ شَيۡءٖۖ وَهُوَ بِكُلِّ شَيۡءٍ عَلِيمٞ (ඔහු පූර්ව ආදශර්යකින් තොර ව මවන) අහස්හි හා පොළොවෙහි උත්පාදකයාය. ඔහුට සහකාරියක් නොසිටියදී ඔහුට දරුවකු ඇති වන්නේ කෙසේද? තවද ඔහු සියලු දෑ මැව්වේය. තවද සියලු දෑ පිළිබඳ ව ඔහු සර්වඥය.ذَٰلِكُمُ ٱللَّهُ رَبُّكُمۡۖ لَآ إِلَٰهَ إِلَّا هُوَۖ خَٰلِقُ كُلِّ شَيۡءٖ فَٱعۡبُدُوهُۚ وَهُوَ عَلَىٰ كُلِّ شَيۡءٖ وَكِيلٞ﴿ ඔහුය නුඹලාගේ පරමාධිපති වන අල්ලාහ්. ඔහු හැර නැමදුම් ලබන්නට කිසිවකු නොමැත.

සියලු දෑහි මැවුම්කරුය. එබැවින් නුඹලා ඔහුට වන්දනාමාන කරනු. තවද සියලු දෑහි භාරකරු වන්නේද ඔහුය.(අල්-අන්ආම්: 101,102)

කුරෙයිෂ් වංශයේ හාෂිමී පරපුරේ අබ්දුල් මුත්තලිබ්ගේ පුත් අබ්දුල්ලාහ්ගේ පුත් මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් නබිවරුන් අතරින් අවසානයා බවත් ධර්ම දූතවරුන් අතරින් ශ්‍රේෂ්ඨතමයා බවත් සාක්ෂි දැරීම. ඒ සමගම එතුමාණන් දහමෙහි කවර කරුණක් ගෙන ආවේ ද එයට අනුගතව අනවබෝධයෙන් හෝ ඉක්මවීමෙන් තොරව එයට ගරු කරමින් පිළිපැදීම.එතුමාණන්ගේ පිළිවෙතට අනුව ක්‍රියා නොකිරීම අනවබෝධයේ කරුණක් වන අතර උත්තරීතර අල්ලාහ් හැර දමා වෙනත් දෑට නමස්කාර කිරීම ඉක්මවා යෑමේ කරුණකි. උදාහරණයක් ලෙස, උත්තරීතර අල්ලාහ්ට පමණක් හැර වෙනත් කිසිවකුට යොමු කිරීමට සුදුසු නැති දෑ දිවුරීම හා ඒවාට ප්‍රාර් ථනා කිරීම වැනිය.එසේම අල්ලාහ් තම ධර්මදූතයා වශයෙන් මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ව එවා ඇති බවත් එතුමාණන් වෙත අල් කුර් ආනය පහළ කළ බවත් මෙම දහම මුළු මිනිස් සංහතියටම ප්‍රචාරය කරන මෙන් එතුමාණන්ට නියෝග කර ඇති බවත් විශ්වාස කිරීම. තවද අල්ලාහ්ට හා ඔහුගේ දූතයාණන්ට ආදරය කළ යුතු බවත් ඒ දෙදෙනාට අවනත වීම සෑම කෙනෙකුටම අනිවාර්ය බවත් අල්ලාහ්ගේ දූතයාණන්ව අනුගමනය කිරීමෙන් මිස අල්ලාහ්ගේ ආදරය සහතික කළ නොහැකි බවත් විශ්වාස කිරීම. සුවිශුද්ධයාණන් මෙසේ පවසයි:﴿قُلۡ إِن كُنتُمۡ تُحِبُّونَ ٱللَّهَ فَٱتَّبِعُونِي يُحۡبِبۡكُمُ ٱللَّهُ وَيَغۡفِرۡ لَكُمۡ ذُنُوبَكُمۡۚ وَٱللَّهُ غَفُورٞ رَّحِيمٞ﴾ "නුඹලා අල්ලාහ් ව ප්‍රිය කරමින් සිටියෙහු නම්, එවිට නුඹලා මා අනුගමනය කරනු. අල්ලාහ් නුඹලා ව ප්‍රිය කරනු ඇත. තවද නුඹලාගේ පාපයන්ට ඔහු සමාව දෙනු ඇත. තවද අල්ලාහ් අති ක්ෂමාශීලී ය; අසමසම කරුණාන්විතය යැයි (නබිවරය!) නුඹ පවසනු."(ආලු ඉම්රාන්: 31)

තවද එතුමාණන් කවර කරුණක් නියෝග කළේ ද එහි එතුමාණන්ට අවනත වීම අනිවාර්ය බවත්, එතුමා දන්වා සිටි තොරතුරු සම්බන්ධයෙන් එතුමාව සහතික කළ යුතු බවත් කවර කරුණක් එතුමාණන් තහනම් කළේ ද එමෙන්ම හෙළා දුටුවේ ද එවැනි දැයින් වැළකී සිටිය යුතු බවත් අල්ලාහ් දහම් ගත කළ දැයින් මිස මිනිසා විසින් අලුතින් බිහි කළ දෑ පදනම් කර ගනිමින් අල්ලාහ්ට නැමදුම් ඉටු නොකළ යුතු බවත් විශ්වාස කිරීම.

අල්ලාහ්ගේ දූතයාණන් එවීමේ ප්‍රඥාව වනුයේ: මිනිසුනට මඟ පෙන්වීම, ඔවුන්ගේ ආගම හා ඔවුන්ගේ මෙලොව ජීවිතය තුළ ඔවුනට ප්‍රයෝජනය හා යහපත ඇති කටයුතු වෙත මඟ පෙන්වීම හා ඔවුන්ගේ පරමාධිපති තෘප්තියට පත්වන දෑ වෙත ඔවුනට මඟ පෙන්වීමය.

දෙවන මූලිකාංගය: සලාතය විධිමත්ව ඉටු කිරීම: එනම් අල්ලාහු අක්බර් යැයි තක්බීර් පවසා ආරම්භ කර අස්-සලාමු අලයිකුම් යන ප්‍රකාශයත් සමග අවසන් කරනු ලබන නියමිත ප්‍රකාශ හා ක්‍රියාවන් තුළින්, අල්ලාහ් වෙනුවෙන් ඉටු කරනු ලබන නැමදුමකි.

එය දහවල් කාලයේ හා රාත්‍රී කාලයේ ඉටු කරනු ලබන සලාත් වාර පහ වේ. එනම්: ෆජ්ර්, ළුහර්, අසර්, මග්රිබ් හා ඉෂා යන සලාත්ය.

සලාතය ඉටු කිරීම සෑම මුස්ලිම් වරයෙකුටම අනිවාර්ය වේ.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත:{إِنَّ ٱلصَّلَوٰةَ كَانَتۡ عَلَى ٱلۡمُؤۡمِنِينَ كِتَٰبٗا مَّوۡقُوتٗا} "සැබැවින්ම සලාතය දේව විශ්වාස කරන්නන් කෙරෙහි කාල නියමයක් වශයෙන් නියම කරනු ලැබූවකි."(සූරා අන්-නිසා: 103)

සලාතයේ ප්‍රඥාව වනුයේ සැබැවින්ම එය ගැත්තා හා ඔහුගේ පරමාධිපති අතර පවතින සම්බන්ධතාවකි; සැනසුමකි; තැන්පත්කමකි. එය පිළිකුල් සහගත දෑ හා අශීලාචාර දැයින් වළක්වයි.

තුන්වන මූලිකාංගය: සකාත් පිරිනැමීම, එනම්, නියමිත වස්තුවෙහි, නියමිත පාර් ශ වයකට නියමිත කාලය තුළ අනිවායර්ය වන වගකීමකි. මෙය ඉස්ලාමයේ මූලිකාංග අතරින් එක් මූලිකාංගයකි. ධනවතුන්ගෙන් ලබා දුප්පතුන්ට පිරිනමනු ලබන අනිවායර්ය දානයකි.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත:﴿خُذۡ مِنۡ أَمۡوَٰلِهِمۡ صَدَقَةٗ تُطَهِّرُهُمۡ وَتُزَكِّيهِم بِهَا﴾ "ඔවුන්ගේ වස්තු වලින් ඔවුන් පිවිතුරු කරවන, ඔවුන් ව පාරිශුද්ධ කරවන (සදකාවක්) දානයක් නුඹ ගනු."(සූරා අත්තව්බා: 103)

සකාත් පිරිනැමීමේ ප්‍රඥාව වනුයේ සැබැවින්ම එය ධනය පිරිසිදු කරයි. එය වධර්නය කරයි, මසුරුකම හා ලෝභකමින් සිත් පිරිසිදු කරයි. ධනවතුන් හා දුප්පතුන් අතර ආදරය ශක්තිමත් කරයි. එහෙයින් ක්‍රෝ්ධය ඉවත් වී ගොස් ආරක්ෂාව ඉහළ නැංවෙයි. සමාජය සතුටට පත් වෙයි.

සිව්වැනි මූලිකාංගය: රමළාන් මාසයේ උපවාසය, එනම් හිජ්රි වර් ෂය අනුව නව වැනි මස දහවල් කාලය තුළ ආහාර ගැනීම, පානය කිරීම හා අඹුසැමි ඇසුර යනාදී උපවාසය බිඳන කරුණුවලින් වැළකී සිටීමය.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත:﴿شَهۡرُ رَمَضَانَ ٱلَّذِيٓ أُنزِلَ فِيهِ ٱلۡقُرۡءَانُ هُدٗى لِّلنَّاسِ وَبَيِّنَٰتٖ مِّنَ ٱلۡهُدَىٰ وَٱلۡفُرۡقَانِۚ فَمَن شَهِدَ مِنكُمُ ٱلشَّهۡرَ فَلۡيَصُمۡهُۖ﴾ "රමළාන් මාසය වනාහි මිනිසාට මඟ පෙන්වන්නක් ලෙසත් යහමඟ පැහැදිලි කරන්නක් ලෙසත් (හොඳ නරක වෙන් කර පෙන්වන) නිණර්යකයක් ලෙසත් එහි අල්-කුආර්නය පහළ කරනු ලැබීය. එබැවින් කවරෙකු එම මාසයට ප්‍රවේශ වූයේ ද ඔහු එහි උපවාසය රකිත්වා!"(අල්-බකරා: 185)

උපවාසය තුළ ඇති ප්‍රඥාව: සවර්බලධාරී අල්ලාහ් පිළිබඳ වූ භක්තිය තහවුරු කිරීම සඳහා වූ මාගර්යකි.

උත්තරීතර අල්ලාහ්ගේ ආශීවර්ාද පිළිබඳ උපවාසකරු වටහා ගැනීම.

උපවාසකරු තම සහෝදර දුප්පතුන් සහ අගහිඟකම් ඇති උපවාසකරු ගැන මෙනෙහි කිරීම.

උපවාසය මුස්ලිම්වරුන්ගේ හැඟීම් ඒකාබද්ධ කරයි.

උපවාසය ශරීර සෞඛ්‍යය හා ශක්තිය ලබා දෙයි.

මේවා හැර වෙනත් කරුණු ද ඇත.

පස්වැනි මූලිකාංගය: හජ් වන්දනාව, හැකියාව ඇත්තන් තම ජීවිත කාලය තුළ ශුද්ධ වූ මක්කාවේ සංකේතාත්මක ශුද්ධ වූ ස්ථාන බැහැ දැකීම. එය, නියමිත වන්දනාමාන ඉටු කිරීම පිණිසය.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත:﴿ وَلِلَّهِ عَلَى ٱلنَّاسِ حِجُّ ٱلْبَيْتِ مَنِ ٱسْتَطَاعَ إِلَيْهِ سَبِيلًاۚ وَمَن كَفَرَ فَإِنَّ ٱللَّهَ غَنِيٌّ عَنِ ٱلْعَٰلَمِينَ﴾ "තවද හජ් සඳහා පහසුකම් ඇත්තවුනට එම ගෘහයෙහි හජ් වන්දනාමාන කිරීම අල්ලාහ් වෙනුවෙන් වූ ජනයා හට පැවරුණු වගකීමකි. තවද කවරෙකු ප්‍රතික්ෂේප කළේ ද සැබැවින්ම අල්ලාහ් ලෝවැසියන්ගෙන් පොහොසත්ය."(ආලු ඉම්රාන්: 97)

හජ් වන්දනාවේ ප්‍රඥාව: එහි උත්තරීතර අල්ලාහ්ගේ ඒකීයත්වය තහවුරු කෙරෙයි. එමෙන්ම ශුද්ධ වූ අල්ලාහ් ගැන වූ භක්තිය සහතික කෙරෙයි. සවර්බලධාරී අල්ලාහ් පිළිබඳ මතකය ස්ථාපිත කරයි. මිනිස් ආත්ම හැඩ ගැසෙයි. නිවැරදි ඒකීයත්වයේ අර්ථය සමූහයාට පුහුණු කරයි. මේ හැර තවත් ප්‍රඥාවන්, ප්‍රතිලාභ හා ප්‍රයෝජන ගණනාවක්ම ඇත.

මෙය සාරාංශගත ප්‍රකාශයක් පමණි. මේ සෑම වගකීමකටම කොන්දේසි, මූලිකාංග හා බොහෝ විස්තර ඇත.අපගේ නබි මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ටත් එතුමාණන්ගේ පවුලේ ඥාතීන් හා එතුමාණන්ගේ මිතුරන් සෑම දෙනාටත් අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අත්වේවා!

අංක: 400

ප්‍රශ්න අංක: 49

**වුළු නම් අධර් දෝවනයේ ක්‍රමය කුමක් ද?**

පිළිතුර:

වැදගත් කරුණ (1)

ප්‍ර- වුළු දෝවනයේ ක්‍රමය කුමක් ද?

පි: වුළු දෝවනයගේ සම්පූර්ණ ක්‍රමය පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

1- පිරිසිදුභාවය හා කිලිටිවලින් පිවිතුරු වීමට මිනිසා නියියත් හෙවත් චේතනාව අදිටන් කර ගනියි. එය සිතෙහි හට ගන්නා කරුණක් වන බැවින්, මුවින් පැවසිය යුතු නැත. අනෙකුත් නැමදුම්වල ද එලෙසමය.

2- බිස්මිල්ලාහ් යැයි පවසයි.

3- පසුව තම අත තුන් වරක් සෝදා හරියි.

පසුව කට කලත්වා තුන්වරක් සෝදා හරියි. (කැලැත්වීම යනු කට තුළ ජලය දමා කැලැත්වීමය)තුන්වරක් ජලය නාසය තුළට යවා තම වමතින් නාසය සීරයි.නාසය සීරීම යනු නාසය තුළට ජලය යවා එය නාසයෙන් පිටතට සීරීමය.

5- තුන් වරක් මුහුණ සෝදා ගනියි. දිගින් මුහුණෙහි සීමාව වනුයේ සාමාන්‍යයෙන් හිසකෙස් වැවෙන ස්ථානයේ සිට යටි රැවුල හා නිකටට පහළ දක්වා ද පළලින් එහි

සීමාව දකුණු කනෙහි සිට වම් කන දක්වා ද වේ.පිරිමියා තම යටි රැවුල සෝදා ගනියි. එයද මුහුණෙහි කොටසකි. එය සැහැල්ලුවේන් වැවී ඇත්නම් එහි බාහිරය මෙන්ම අභ්‍යන්තරය ද සෝදා ගත යුතුයි. එය ඝනව වැවී ඇත්නම්, එනම් එය සම ආවරණය කරන පරිදි වැවී ඇත්නම් එහි මතුපිට පමණක් අතුල්ලමින් සෝදා හරියි. එමෙන්ම එය අතුල්ලා ගනියි.

6- පසුව වැළමිට දක්වා තුන්වරක් අත සෝදා ගනියි. අතෙහි සීමාව නියපොතු ඇතුළුව ඇඟිලි තුඩුවල සිට බාහුව ආරම්භ වන කොටස දක්වා වේ. අත් සේදීමට පෙර සමට ජලය ළඟාවීමට බාධා වන පරිදි අතෙහි ඇලී ඇති පිටි, පස් හා අලේපන වැනි දෑ ඉවත් කළ යුතුය.

7- ඉන් පසුව ජලය රැගෙන තම හිස හා තම කන් දෙක එක් වරක් පිරි මදියි.හිස ජලයෙන් පිරිමැදීමේ ක්‍රමය වනුයේ. තෙත් අතින් තම හිසෙහි ආරම්භ කොටසේ සිට පසුගෙල දක්වා පිරිමදිමින් ගෙන ගොස් නැවතත් ආරම්භ කළ තැනටම ගෙන ඒමය. පසුව තම දබර ඇඟිලි දෙක දෙකන්හි ගුලෙහි ඇතුළු කොට මහපොට ඇඟිලි දෙක එහි මතුපිටින් තබා පිරිමදියි.කාන්තාවකගේ හිසකෙස් සම්බන්ධයෙන් බලන කල එය එල්ලෙමින් තිබුණ ද ගොතා තිබුණ ද හිසෙහි ආරම්භයේ සිට පසුගෙලෙහි හිසකෙස් වැවෙන ස්ථානය දක්වා පිරිමැදිය යුතුය. ඊට බාහිර ව දිගින් පවතින ඇගේ හිසකෙස් පිරිමැදීම අනිවාර්ය වන්නේ නැත.

8- පසුව ඔහුගේ දෙපා වළලු කර දක්වා තුන්වරක් සොදා හරියි. වළලු කර යනු කෙණ්ඩයේ පහළ කොටසෙහි නෙරා ගිය අස්ථි දෙකය.

- කවරෙකු ජලය නොලැබුවේ ද ඔහු තයම්මුම් කර ගනී. තයම්මුම් යනු: ජලය නොමැති අවස්ථාවක හෝ එය භාවිත කිරීමට යම් බාධාවක් ඇති වූ අවස්ථාවක, මහපොළොවෙන් උසට වැඩී ඇති පස් හෝ ඒ හා සමාන වෙනත් දෙයක් භාවිතා කරමින් සිදු කරන ක්‍රියාවලියකි.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත:﴿ فَلَمْ تَجِدُوا۟ مَآءً فَتَيَمَّمُوا۟ صَعِيدًا طَيِّبًا فَٱمْسَحُوا۟ بِوُجُوهِكُمْ وَأَيْدِيكُمْ ۗ إِنَّ ٱللَّهَ كَانَ عَفُوًّا غَفُورًا ﴾ "නුඹලාට ජලය නොලැබුනේ නම්, නුඹලා පිරිසිදු පස් සොයා ගනු. තවද නුඹලාගේ මුහුණු ද නුඹලාගේ අත් ද නුඹලා (එයින්) පිරිමදිනු. සැබැවින්ම අල්ලාහ් (සෑම වරදකට ම දඬුවමන් නොකර) නොසලකා හැර පාපක්ෂමාව පිරිනමන්නාය."(අන්-නිසා: 43)

තයම්මුම්හි ක්‍රමය වනුයේ: අත්ලෙන් එක් වරක් පස් මත ගසා, මුහුණ මත හා දෑතෙහි මැණික් කටුව මතුපිට එක් වරක් බැගින් පිරිමැදීමය. අම්මාර් ඉබ්නු යාසීර් (රළියල්ලාහු අන්හු) තුමාහට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ."සැබැවින්ම මෙලෙස කිරීම ප්‍රමාණවත් වේ" යැයි පවසා තම අත් දෙක පොළොව මත ගසා, ඒ දෙකෙහි පිඹ, පසු ව නබිතුමාණෝ ඒ දෙකින් තම මුහුණ හා එතුමාණන්ගේ අත් දෙක පිරිමැද්දාහ.මෙය බුහාරි හා මුස්ලිම් විසින් වාර් තා කර ඇත.

ඉහත සඳහන් කරුණට සාධකය වනුයේ උස්මාන් තුමාගේ සේවකයකු වූ හුම්රාන් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර් තා කරන ලද හදීසයයි. ඇත්තෙන්ම උස්මාන් (රළියල්ලාහු අන්හු) තුමා,ජලය ගෙන්වා ගෙන වුළු ධෝවනය කරන්නට විය. එතුමා

අත් දෙක තුන් වරක් සෝදා හැරියේය. පසු ව කට පිරිසිදු කොට නාසය සීරා පිරිසිදු කළේය. පසු ව තම මුහුණ තුන්වරක් සෝදා තම දකුණත වැළමිට දක්වා තුන්වරක් සේදුවේය. එමෙන්ම වමත ද වැළමිට දක්වා තුන්වරක් සේදුවේය. පසු ව තම හිස ජලයෙන් පිරිමැද්දේය. පසු ව තම දකුණු කකුල වළලුකර දක්වා සේදුවේය. පසු ව ඒ අයුරින්ම වම් කකුල ද සේදුවේය. පසු ව එතුමා නබිතුමාණන් මේ මා කළ වුළු ධෝවනය මෙන් වුළු කරනු මම දැක ඇත්තෙමි. පසුව අල්ලාහ්ගේ දූතයාණෝ මෙසේ පැවසූහ: “මේ මා කළ වුළු ධෝවනය මෙන් කවරෙකු වුළු ධෝවනය කර, අනතුරු ව එහි දී වුළු අවලංගු නොවූ තත්ත්වයෙන් රකආත් දෙකක් ඉටු කළේ ද, පෙර කළ පාපකම් සඳහා ඔහුට සමාව දෙනු ලැබේ.”මෙය මුස්ලිම් විසින් වාතර්ා කර ඇත.

උත්තරීතරයාණන් තවදුරටත් මෙසේ ප්‍රකාශ කරයි:﴿يَـٰٓأَيُّهَا ٱلَّذِينَ ءَامَنُوٓاْ إِذَا قُمۡتُمۡ إِلَى ٱلصَّلَوٰةِ فَٱغۡسِلُواْ وُجُوهَكُمۡ وَأَيۡدِيَكُمۡ إِلَى ٱلۡمَرَافِقِ وَٱمۡسَحُواْ بِرُءُوسِكُمۡ وَأَرۡجُلَكُمۡ إِلَى ٱلۡكَعۡبَيۡنِۚ وَإِن كُنتُمۡ جُنُبٗا فَٱطَّهَّرُواْۚ وَإِن كُنتُم مَّرۡضَىٰٓ أَوۡ عَلَىٰ سَفَرٍ أَوۡ جَآءَ أَحَدٞ مِّنكُم مِّنَ ٱلۡغَآئِطِ أَوۡ لَٰمَسۡتُمُ ٱلنِّسَآءَ فَلَمۡ تَجِدُواْ مَآءٗ فَتَيَمَّمُواْ صَعِيدٗا طَيِّبٗا فَٱمۡسَحُواْ بِوُجُوهِكُمۡ وَأَيۡدِيكُم مِّنۡهُۚ مَا يُرِيدُ ٱللَّهُ لِيَجۡعَلَ عَلَيۡكُم مِّنۡ حَرَجٖ وَلَٰكِن يُرِيدُ لِيُطَهِّرَكُمۡ وَلِيُتِمَّ نِعۡمَتَهُۥ عَلَيۡكُمۡ لَعَلَّكُمۡ تَشۡكُرُونَ﴾ "අහෝ දේවත්වය විශ්වාස කළවුනි! නුඹලා සලාතයට සූදානම් වූ විට නුඹලාගේ මුහුණු ද නුඹලාගේ අත් ද සෝදා ගනු. තවද නුඹලාගේ හිස් (ජලයෙන්) පිරිමදිනු. තවද නුඹලාගේ පාද ද වළලු කර දක්වා සෝදා ගනු. නුඹලා ස්නානය අනිවාර්‍ය වූ කෙනෙකු ව සිටින්නෙහු නම් (ස්නානය කොට) පිරිසිදු වනු. නමුත් නුඹලා රෝගී ව හෝ යම් ගමනක නිරත ව සිටියෙහු නම් හෝ නුඹලා අතරින් කිසිවකු මළමූත්‍රා පහකොට පැමිණියේ නම් හෝ නුඹලා (නුඹලාගේ) බිරියන් (ලිංගික ව) ස්පර් ශ කළෙහු නම් හෝ ඉන්පසුව (පිරිසිදු වීමට) නුඹලා ජලය නොලැබුවෙහු නම් පිරිසිදු පසින් නුඹලාගේ මුහුණුද නුඹලාගේ අත් ද පිරිමදිනු. නුඹලාට කිසිදු දුෂ්කරතාවක් ඇති කිරීමට අල්ලාහ් අපේක්ෂා නොකරයි. නමුත් නුඹලා කෘතවේදී විය හැකි වනු පිණිස නුඹලා ව පිරිසිදු කිරීමටත් ඔහුගේ ආශිවර්ාදයන් නුඹලා කෙරෙහි පූර්ණවත් කිරීමටත් අපේක්ෂා කරයි."(අල්-මාඉදා: 6)අපගේ නබි මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ටත් එතුමාණන්ගේ පවුලේ ඥාතීන් හා එතුමාණන්ගේ මිතුරන් සැම දෙනාටත් අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අත්වේවා!

ඒකාබද්ධිත අංකය: 3060

ප්‍රශ්න අංක: 50

**සලාතයේ ක්‍රමය කුමක් ද?**

පිළිතුර:

වැදගත් කරුණ (1)

ප්‍ර- සලාතයේ ක්‍රමය කුමක් ද?

පි: සලාතයේ ක්‍රමය පහත සඳහන් පරිදිය.

1- කිසිදු වෙනස් වීමකින් හෝ හැරීමකින් තොරව මුළු ශරීරයම කිබ්ලා දෙසට හැරවීම.

2- මුවින් ප්‍රකාශ කිරීමකින් තොරව, සලාත් ඉටු කරන බවට අපේක්ෂා කරමින් සලාතය සඳහා, තම හදවතින් තබන නිය්යත් හෙවත් අදිටන.

පසුව 'අල්ලාහු අක්බර්' යැයි ප්‍රාරම්භක තක්බීරය පවසයි. පසුව තක්බීර් පවසන අවස්ථාවේ තම දෙඅත් උරහිසට සමාන්තරව පිහිටන සේ ඔසවා ගනියි.

4- පසුව තම දකුණත වමතෙහි මතුපිටින් පිහිටන සේ පපුවට ඉහළින් තබා ගනී.

5- පසුව ආරම්භක ප්‍රාථර්නාව පවසයි: එහි දී, اللهم بَاعِدْ بَيْنِي وَبَيْنَ خَطَايَايَ كَمَا بَاعَدْتَ بَيْنَ الْمَشْرِقِ وَالْمَغْرِبِ ، اللهم نقِّنِي مِنْ خَطَايَايَ كَمَا يُنَقَّى الثَّوْبُ الْأَبْيَضُ مِنْ الدَّنَسِ ، اللهم اِغْسِلْنِي مِنْ خَطَايَايَ بِالْمَاءِ وَالثَّلْجِ وَالْبَرَدِ තේරුම : යා අල්ලාහ්! නැගෙනහිර හා බටහිර අතර ඔබ දුරස් කළාක් මෙන් මා හා මාගේ පාපයන් අතර දුරස් කරනු මැනව! යා අල්ලාහ්! සුදු වස්ත්‍රයක කිලිටි පිරිසිදු කරනු ලබනවාක් මෙන් මාගේ පාපයන්ගෙන් මා පිරිසිදු කරනු මැනව! ජලය, පිනි කැට හා හිම තුළින් මාගේ පාපයන්ගෙන් මා සෝදා හරිනු මැනව!

එසේ නැතහොත් මෙසේ පවසයි:"සුබ්හානකල්ලාහුම්ම වබිහම්දික වතබාරකස්මුක වතආලා ජද්දුක වලාඉලාහ ගයිරක." තේරුම: යා අල්ලාහ් ඔබට උපහාර දක්වන අතරම සුවිශුද්ධද කරමි. ඔබේ නාමයන් සමෘධිමත්ය. ඔබේ කීතර්ීය උත්තරීතරය. නැමදුමට සුදුස්සා ඔබ හැර වෙන කිසිවෙක් හෝ කිසිවක් නොමැත.

6- පසුව ආරක්ෂාව පතමින් මෙසේ පවසයි:"අඌදු බිල්ලාහි මිනෂ්-ෂෙයිතානිර් රජීම්" හෙළන ලද ෂෙයිතාන්ගෙන් ආරක්ෂාව අල්ලාහ්ගෙන් පතමි.

7- පසුව බිස්මිල්ලාහ් පවසා සූරා අල්-ෆාතිහා පාරායනය කරයි.﴿ بِسْمِ اللهِ الرَّحْمنِ الرَّحِيمِ අපරමිත දයාන්විත අසමසම කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙන් الْحَمْدُ للهِ رَبِّ الْعَالَمِينَ الْحَمْدُ للهِ رَبِّ الْعَالَمِينَ සියලු ප්‍රශංසා ලෝකයන් හි පරමාධිපති වූ අල්ලාහ්ට ම ය.الرَّحْمـنِ الرَّحِيمِ الرَّحْمـنِ الرَّحِيمِ අපරිමිත දයාන්විතය අසමසම කරුණාන්විත ය. مَالِكِ يَوْمِ الدِّينِ مَالِكِ يَوْمِ الدِّينِ විනිශ්චය දිනයේ රජු ය.إِيَّاكَ نَعْبُدُ وإِيَّاكَ نَسْتَعِينُ إِيَّاكَ نَعْبُدُ وإِيَّاكَ نَسْتَعِينُ ඔබට ම අපි නමදිමු. ඔබගෙන් ම අපි උදව් පතමු. اهدِنَـــا الصِّرَاطَ المُستَقِيمَ اهدِنَـــا الصِّرَاطَ المُستَقِيمَ අපට ඍජු මඟ පෙන්වනු මැනව. صِرَاطَ الَّذِينَ أَنعَمتَ عَلَيهِمْ غَيرِ المَغضُوبِ عَلَيهِمْ وَلاَ الضَّالِّينَ صِرَاطَ الَّذِينَ أَنعَمتَ عَلَيهِمْ غَيرِ المَغضُوبِ عَلَيهِمْ وَلاَ الضَّالِّينَ﴾ ඔබ කවරෙකු ට ආශිර්වාද කළේ ද එම මාගර්යයි. තමන් කෙරෙහි කෝපය ට ලක් වූවන් හෝ මුළාවූවන් ගේ මාර් ගය නොව.(සූරා අල්-ෆාතිහා: 1-7)

පසුව 'ආමීන්' යැයි පවසයි. ඉන් අදහස් කරනුයේ අහෝ අල්ලාහ් පිළිගනු මැනව යන්නයි.

8- පසුව අල් කුආර්නයෙන් පහසු කොටසක් පාරායනය කරයි. සුබ්හු සලාතයේ දී දීගර් ලෙස පාරායනය කරයි.

9- පසු ව රුකූඋ කරයි. එනම්, අල්ලාහ්ට ගරුබුහුමන් කිරීම සඳහා තම පිට කොන්ද නැවීමය. රුකූඋ කරන මොහොතේ ඔහු තක්බීර් පවසයි. ඔහුගේ දෑත් ඔහුගේ උරහිස් දෙකට සමාන්තරව ඔසවයි. සුන්නාව වනුයේ: ඔහුගේ පිට නමා දිගුහැර, ඔහුගේ හිස සමාන්තවරව තබාගෙන ඔහුගේ දෑත් ඇඟිලි ඇත් කරමින් දණහිස් දෙක මත තැබීමය.

10- රුකූඋ හි ඔහු: සුබ්හාන රබ්බියල් අළීම් යැයි තුන්වරක් පවසයි. ඊට අමතරව සුබ්හානකල්ලාහුම්ම වබිහම්දික අල්ලාහුමග් ෆිලරී යැයි පවසා සිටින්නේ නම්, එය හොඳය.

11- පසුව "සමිඅල්ලාහු ලිමන් හමිදා" යැයි පවසමින් රුකූඋ සිට තම හිස ඔසවා ගනියි. එවිට ඔහුගේ දෑත් ඔහුගේ උරහිසට සමාන්තරව ඔසවා ගනියි. ඉමාම්ව පිළිපදින මඃමූම්වරු "සමිඅල්ලාහු ලිමන් හමිදා" යැයි නොපවසයි. ඔවුන් ඒ වෙනුවට පවසනුයේ "රබ්බනා වලකල් හම්දු" යනුවෙනි.

12- ඉන් නැගිට්ට පසු මෙසේ පවසයි: රබ්බනා වලකල්- හම්දු මිල් අස්සමාවාති වල් අළ්රී වමිල්අ මා ෂිඃත මින් ෂෙයිඉන් බඃද්' තේරුම: අහෝ පරමාධිපතියාණනි, අහස් හා පොළොව පිරුණු, ඔබේ කැමැත්ත පිරුණු සියලු දැහි ප්‍රශංසා, ඔබ සතුය.

13- පසුව පළමු සජදාව ඉටු කරයි. ඔහු සුජූද් කරන අවස්ථාවෙහි අල්ලාහු අක්බර් යැයි පවසයි. නළල හා නාසය, අත්ල දෙක, දණහිස් දෙක, පා ඇඟිලි තුඩු යනාදී ශරීර අවයව සතක් මත ඔහු සුජූද් කරයි: ඔහුගේ බාහු දෙක ඇළපත් දෙකින් ඈත් කර තබා ගනියි. අත් දෙක පොළොවට නිදිකරවා නො තබයි. එහි ඇඟිලි තුඩු කිබ්ලා දෙසට හරවා තබා ගනියි.

14- සුජූද් හි ඔහු: සුබ්හාන රබ්බියල් අඃලා යැයි තුන්වරක් පවසයි. ඊට අමතරව සුබ්හානකල්ලාහුම්ම වබිහම්දික අල්ලාහුමග් ෆිර් ලි යැයි පවසා සිටින්නේ නම්, එය හොඳය.

15- පසුව අල්ලාහු අක්බර් යැයි පවසා සුජූද් ඉරියව්වෙන් තම හිස ඔසවා ගනියි.

16- පසුව සජදා ඉරියවන්වන් දෙකෙහිම තම වම් කකුල මත වාඩි වී, තම දකුණු කකුල සිටුවා තබා ගනියි. තම අත් දෙක තම කළවා දෙක හා තම දණහිස් දෙක මත තබා ගනියි.

17- සජදා දෙක අතර වාඩි වී සිටිය දී මෙසේ පවසයි: අල්ලාහුම්මඃෆිර් ලි වැ හම්නී වහ්දිනී වර් සුක්නී, වජ්බුර් නී, වආෆිනී. තේරුම: යා අල්ලාහ් මාහට ක්ෂමා දෙනු මැනව. මට කරුණා කරනු මැනව. මට ඍජු මාඟ පෙන්වනු මැනව. පෝෂණ සම්පත් ලබා දෙනු මැනව. මට සුවය ලබා දෙනු මැනව. යහපත් දේ කෙරෙහි මා යොමු කරනු මැනව.

18- පසුව දෙවන සජදාවත් පළමු සජදාව මෙන්ම එහි කිව යුතු දෑ පවසමින් හා එහි කළ යුතු දෑ පිළිපදිමින් ඉටු කරයි. ඔහු සුජූද් කරන අවස්ථාවේ අල්ලාහු අක්බර් යැයි තක්බීර් පවසයි.

19- පසුව දෙවන සුජූදය නිමා කර අල්ලාහු අක්බර් යැයි පවසා නැගිට සිටියි. පසුව දෙවන රකආතය පළමු රකආතය මෙන්ම එහි කිව යුතු දෑ පවසමින් හා එහි කළ යුතු දෑ පිළිපදිමින් ඉටු කරයි. නමුත් එහි දී ආරම්භක ප්‍රාථර්නාව පවසන්නේ නැත.

20- දෙවන රකආතය නිමා කිරීමෙන් පසු ව අල්ලාහු අක්බර් යැයි පවසා වාඩි වෙයි. සජදා දෙක අතර වාඩි වූ පරිදිම ඒ හා සමානව වාඩි වෙයි.

21- එම ඉඳුමෙහි මෙසේ තෂහ්හුද් පාරායනය කරයි:"අත්තහිය්යාත්තු ලිල්ලාහි වස්සලවාතු වත් තයියිබාතු අස්සලාමු අලෙයික අයියුහන් නබියියු වරහ්මතුල්ලාහි වබරකාතුහු අස්සලාමු අලෙයිනා වඅලා ඉබාදිල්ලාහිස් සාලිහීන්. අෂ්හදු අන්ලා ඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු. අල්ලාහුම්ම සල්ලි අලා

මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා සල්ලයිත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුන් මජීද්. වබාරික් අලා මුහම්මදින් වඅලා අලි මුහම්මදින් කමා බාරක්ත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුන් මජීද්. අල්ලාහුම්ම ඉන්නී අඌදුබික මින් අදාබි ජහන්නම වමින් අදාබිල් කබ්රි වමින් ෆිත්නතල් මහ්යා වල්මමාති වමින් ෆිත්නතිල් මසීහද් දජ්ජාල්" තෙරුම: පැතුමන් ආශිවර්ාදයන් හා යහපත අල්ලාහ්ටම හිමිය. අහෝ නබිතුමනි, අල්ලාහ්ගේ ශාන්තිය කරුණාව හා අභිවෘද්ධිය ඔබට හිමිවේවා. අපටත් අල්ලාහ්ගේ සැදැහැමි ගැත්තන් සියලු දෙනාටත් අල්ලාහ්ගේ ශාන්තිය අත්වේවා. නමැදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙන දෙවියකු නොමැති බව මම සාක්ෂි දරමි. සත්‍ය වශයෙන්ම මුහම්මද්(සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔහුගේ ගැත්තා හා ඔහුගේ දූතයා බව ද මම සාක්ෂි දරමි. යා අල්ලාහ්! ඉබ්රාහීම් තුමා හා එතුමාගේ පවුලේ අයට ශාන්තිය පහළ කළා සේම මුහම්මද් තුමා හා එතුමාගේ පවුලේ අයට ද ශාන්තිය පහළ කරත්වා. යා අල්ලාහ්! ඉබ්‍රාහිම් තුමා හා එතුමන්ගේ පවුලේ අයට සමෘධිය ඇති කළා සේම මුහම්මද් තුමාට හා එතුමාගේ පවුලේ අයටද සමෘධිය ඇති කරත්වා. සත්‍ය වශයෙන්ම ඔබ ප්‍රශංසා ලැබිය යුත්තාය. කීර් තියේ හිමිය. යා අල්ලාහ් කබ්රයේ වේදනාවෙන් ද අපායේ වේදනාවෙන් ද ජීවිතයේ හා මරණයේදී ඇතිවන කලබලකාරි ස්වභාවයෙන්ද මසීහිද් දජ්ජාල්ගේ අර් බුදවලින් ද නියත වශයෙන්ම මම ඔබෙන් ආරක්ෂාව පතමි.පසුව තමන් කැමති මෙලොව හා මතුලොව යහපත තම පරමාධිපතිගෙන් පතයි.

22- පසුව 'අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලාහ්' යැයි පවසමින් දකුණ දෙසටත් එලෙසම වම් දෙසටත් සලාම් දෙයි.

23- රකආත් තුනක් හෝ හතරක් සහිත සලාතයක් වී නම්, පළමු තෂහ්හුද් හි ආවසානයත් සමග නතර කර ගනී. එනම්:"අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහූ වරසූලුහු"

24- පසුව අල්ලාහු අක්බර් යැයි පවසා නැවත නැගිට සිටියි. එවිට තම අත් දෙක උරහිසට සමාන්තවර ඔසවා ගනියි.

25- පසුව දෙවන රකආතය ඉටු කළ ක්‍රමය අනුව ඔහුගේ ඉතිරි සලාතය ද ඉටු කරයි. නමුත් එහිදී ඔහු සූරා අල්-ෆාතිහා පාරායනය කිරීම සීමා කර ගනියි.

26- පසුව තවරුක් ඉඳුමෙන් වාඩිවෙයි. එනම් තම දකුණු කකුල සිටුවා තබා, තම වම් කකුල තම කෙණ්ඩයට යටින් පිටතට පිහිට සේ තබා, පොළොවේ වාඩි වීමට හැකි පරිදි වාඩි වෙයි. තම අත් දෙක පළමු තෂහ්හුද් හි තබා ගත් පරිදිම තම කලවා දෙක මත තබා ගනියි.

27- එම ඉඳුමෙහි තෂහ්හුද් සම්පූණර්යෙන්ම කියවයි.

28- පසුව 'අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලාහ්' යැයි පවසමින් දකුණ දෙසටත් එලෙසම වම් දෙසටත් සලාම් දෙයි. අපගේ නබි මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් හට ශාන්තිය හා සමාදානය අත්වේවා!

ඒකාබද්ධිත අංකය: 3070

ප්‍රශ්න අංක: 65

**මුස්ලිම්වරු කෑබාවට නමදිනවාද?**

පිළිතුර:

වැදගත් කරුණ (1)

ප්‍ර- කෑබාව යනු කුමක් ද? මුස්ලිම්වරු කෑබාවට නමදිනවා ද?

ශුද්ධ වූ කෑබාව යනු මුස්ලිම්වරු තම සලාතයේ දී යොමු වන දිශාවයි. උත්තරීතරයාණෝ මෙසේ පවසයි:﴿فَلَنُوَلِّيَنَّكَ قِبۡلَةٗ تَرۡضَىٰهَاۚ فَوَلِّ وَجۡهَكَ شَطۡرَ ٱلۡمَسۡجِدِ ٱلۡحَرَامِۚ وَحَيۡثُ مَا كُنتُمۡ فَوَلُّواْ وُجُوهَكُمۡ شَطۡرَهُۥۗ﴾ "(නබිවරය!) නුඹ ප්‍රිය කරන දිශාව දෙස සැබැවින් ම අපි නුඹ ව හරවන්නෙමු. එහෙයින් නුඹගේ මුහුණ ශුද්ධ මස්ජිදය වෙත හරවනු. (ජනයිනි!) නුඹලා කොතැනක සිටිය ද (සලාතයේ දී) නුඹලාගේ මුහුණු ඒ දෙසට හරවනු."(අල්-බකරා: 144)හජ් වගකීම හා උම්රා පිළිවෙත ඉටු කරන අතරවාරයේ ඒ වටා ගමන් කරති. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි:﴿وَلۡيَطَّوَّفُواْ بِٱلۡبَيۡتِ ٱلۡعَتِيقِ﴾ "...තවද ඉපැරණි ගෘහය (වන කෑබාව) වටා ඔවුහු සක්මන් කරත්වා!"(අල්-හජ්: 29)

එය ශුද්ධ වූ මක්කාවේ පිහිටි මහඟු ගොඩනැගිල්ලකි. අල්ලාහ් තම නබිවරයකු වූ තම මිතුරා වූ ඉබ්‍රාහීම් (අලයිහිස් සලාම්) තුමාණන්ට එය ඉදි කරන මෙන් නියෝග කළේය. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.﴿وَإِذۡ بَوَّأۡنَا لِإِبۡرَٰهِيمَ مَكَانَ ٱلۡبَيۡتِ أَن لَّا تُشۡرِكۡ بِي شَيۡـٔٗا وَطَهِّرۡ بَيۡتِيَ لِلطَّآئِفِينَ وَٱلۡقَآئِمِينَ وَٱلرُّكَّعِ ٱلسُّجُودِ﴾ "තවද මට කිසිවක් ආදේශ නොකරනු. තවද නුඹ (කෑබා ව වටා) තවාෆ් කරන්නන්හටත් නැගිට නැමදුම් ඉටු කරන්නන් හටත් (කොන්ද නමා දණහිස් අල්ලා) රුකූඋ කරන්නන් හටත් (නළල බිම තබා) සුජූද් කරන්නන්හටත් මාගේ ගෘහය පිරිසිදු කරනු යැයි පවසා (කෑබා ව නම්) ගෘහයේ ස්ථානය ඉබ්රාහීම්ට අපි පවරා දුන් අවස්ථාව සිහිපත් කරනු."(අල්-හජ්: 26)

එය උත්තරීතර අල්ලාහ්ට නැමදුම් කිරීම සඳහා තබන ලැබූ පළමු නිවසයි. සුවිශුද්ධයාණන් මෙසේ පවසයි:﴿إِنَّ أَوَّلَ بَيۡتٖ وُضِعَ لِلنَّاسِ لَلَّذِي بِبَكَّةَ مُبَارَكٗا وَهُدٗى لِّلۡعَٰلَمِينَ﴾ "ලෝ වැසියනට මඟ පෙන්වන්නක් හා සෞභාග්‍යයක් ලෙස ජනයාට (නැමදුම සඳහා) තබනු ලැබූ ප්‍රථම ගෘහය බක්කා (නොහොත් මක්කා) වෙහි පිහිටා ඇති දෑ ය.(ආලු ඉම්රාන්: 96)

දෙවන ප්‍රශ්නයට පිළිතුර වනාහි, සැබැවින්ම මුස්ලිම්වරු කෑබාවට හෝ හජර් අල් අස්වද් නම් කළු පැහැති ගලට හෝ නැමදුම් නොකරති. ඔවුහු ඒ දෙකට යටහත් පහත් නොවෙති. නමුත් ඒ දෙක සැළකිල්ලට ගනිමින් ගරු කරති.තවද කෑබාවෙන් සහ හජර් අල් අස්වද් නම් කළු ගලෙන් කිසිදු හානියක් හෝ ප්‍රයෝජනයක් හෝ ඔවුනට නැති නිසාත්, මග පෙන්වීමක් හෝ මාගෝර්පදේශයක් තිබිය හැකි කිසිවක් එහි දකින්නට නොමැති නිසාත්, කිසිදු නියෝගයක් හෝ තහනමක් හෝ ඔවුහු එයින් නොලබති. එය සිපගැනීමට හා අගය කිරීමට පමණක් සීමා වේ. කෑබාව වෙත හැරීම ඔවුන්ගේ එකමුතුකමේ සහ ඔවුන්ගේ ඉලක්කයේ ඓක්‍යයේ විද්‍යාමානයයි. ඔවුන් කෑබාවට නැමදුම් කිරීමෙන් තොරව අල්ලාහ්ගේ නියෝගය පිළිපදිමින් අල්ලාහ්ට පමණක් නැමදුම් කරමින් එය වටා සක්මන් කරති.සැබැවින්ම එය කිසිදු හානියක් හෝ සෙතක් හෝ ලබා නොදෙන කළු ගලක් බව මුස්ලිම්වරු දනිති. නමුත් මුස්ලිම්වරයා

උපරිමයෙන්ම අල්ලාහ්ගේ නියෝගය පිළිපදියි. හේතුව සැබැවින්ම එය, ලෝ වැසියන්ගේ පරමාධිපතියාණන් වූ අල්ලාහ්ට නැමදුම් කිරීමට යොමු කරන බැවිනි.

උමර් (රළියල්ලාහු අන්හු) තුමා හජර් අල් අස්වද් නම් ගල සිප ගත් අවස්ථාවේ ඒ ගැන කළ ප්‍රකාශය මෙසේය:"සැබැවින්ම ඔබ හානියක් කළ නොහැකි, සෙතක් සැළසිය නොහැකි ගලක් බව මම දනිමි. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔබව සිපගනු මා දැක නොතිබුණේ නම් මා ඔබව සිප නොගන්නෙමි."මෙය බුහාරි හා මුස්ලිම් විසින් වාතර්ා කර ඇත.අපගේ නබි මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ටත් එතුමාණන්ගේ පවුලේ ඥාතීන් හා එතුමාණන්ගේ මිතුරන් සැම දෙනාටත් අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අත්වේවා!

ඒකාබද්ධිත අංකය: 1110

තෝරාගත් ප්‍රශ්න: ඉස්ලාම් ගැන නිතර අසන ප්‍රශ්න ශබ්දකෝෂයෙන් ...................... 1
(අකර්ානුල් ඊමාන් හෙවත් දේව විශ්වාසයේ මූලිකාංග පිළිබඳ කොටස) ................... 1
ඉස්ලාමයේ මූලික කුළුණු පහ කුමක් ද? ........................................................ 1
වුළූ නම් අධර් දෝවනයේ ක්‍රමය කුමක් ද? ....................................................... 4
සලාතයේ ක්‍රමය කුමක් ද? ............................................................................ 6
මුස්ලිම්වරු කඃබාවට නමදිනවාද? ................................................................ 10